# 22

# නවගමුව දේවාලය ප්‍රමුඛව පත්තිනි ඇදහිල්ල හා බැඳි ජන විශ්වාස

*එච්. ඩී. එන්. බුද්ධිකා* [1]
HU/2012/0064

හෙළදිව සංස්කෘතියේ පවතින ප්‍රධාන ඇදහිලි හා වැඳුම් පිදුම් අතර ප්‍රමුඛව පවතින "පත්තිනි ඇදහිල්ල" හා ඒ හා බැඳි ජන විශ්වාස පිළිබඳ අධ්‍යයන කිරීම මෙම පර්යේෂණයේ අරමුණ වේ. පත්තිනි පිළිබඳ ප්‍රථම මූලාශ්‍රය මහා භාරතයේ විසූ ඉලංගෝ ආඩිගල් නම් කවියා විසින් රචනා කරන ලද සීලප්පදිකාරම් නම් කාව්‍ය ග්‍රන්ථයෙන් හමුවන අතර හෙළදිව රජකම් කළ ගජබා රජුගේ කාලවකවානුව තුළදී පත්තිනි පුවත හෙළදිව ඉතිහාසයට එක්ව ජනප්‍රවාදයක් ලෙස පැවත එයි. පත්තිනි දේවියගේ උපත පිළිබඳ මෙරට හා දකුණු ඉන්දීය ජන සමාජය තුළ ජනප්‍රවාද රාශියක් ඇත. එමෙන්ම මෙරට අදටත් ඉතා ඉහළ ප්‍රසිද්ධියක් හා ජනතා ආකර්ෂණයක් දිනා සිටින "නවගමුව දේවාලය" පත්තිනි ඇදහිල්ල ශ්‍රී ලාංකේය ජන සමාජය තුළ තදින්ම මුල් බැස පවතින්නක් බවට නිදසුනකි. පත්තිනි දේවියට පුද සත්කාර කිරීම හා පිළිවෙත් කිරීම තුළින් සශ්‍රීකත්වය හා දරුවන් ලැබීම, ලෙඩ රෝග සුවකිරීම, කිරි අම්මා දනය තුළින් ගැමි ජනතාව විශ්වාස කරන්නා වූ අරමුණු මුදුන් පත් වන බව කිව හැකි ය. එම නිසා මාගේ නිගමනය වනුයේ ශ්‍රී ලාංකේය ජන සමාජය තුළ පවතින පත්තිනි ඇදහිල්ල හුදෙක් මිථ්‍යාව පෙරටු කර ගත්තක් නොව නියමාකාර පුද පූජා කිරීම තුළින් අපේක්ෂා කරන්නා වූ අරමුණු කරා ළඟා වීමට හැකි සංකල්පයක් බව ය.

ප්‍රමුඛ පදඃ පත්තිනි ඇදහිල්ල, නවගමුව දේවාලය, ජන සමාජය

---

*1 ප්‍රාසංගික කලා (විශේෂවේදී) දෙවන වසර*